# සිංහලයෝ ද ආදිවාසීහු වෙති

පස්වැනි සියවසෙන් පමණ පසුව සිංහල බෞද්ධයන් ථෙරවාද බුදුදහම රැකීම තම පරම යුතුකම හා වගකීම ලෙස සලකා කටයුතු කර ඇතැයි අපි කීවෙමු. එහෙත් භික්ෂූන් වහන්සේ මෙරට අධ්‍යාපනය තමන් අතට ගෙන ඇත්තේ එයට ද පළමුව ය. බද්දේගම විමලවංශ හිමියන් තමන් වහන්සේ විසින් රචිත ගිහි අධ්‍යාපනය හා වෙනත් පොතපතින් පෙන්වා දී ඇත්තේ භික්ෂූන් වහන්සේ බමුණන්ගෙන් අධ්‍යාපනය ලබාදීමේ වගකීම ලබාගත් බව ය. එහෙත් බමුණන්ට ඈත කාලයේ දී පවා අධ්‍යාපනයෙහි එතරම් වැදගත් තැනක් හිමිවීද යන්න ප්‍රශ්නයකි.

පණ්ඩුකාභය කුමරා පණ්ඩුල නම් බමුණකුගෙන් ශිල්ප හැදෑරූ බව මහාවංසයෙහි සඳහන් වෙයි. එහෙත් එපමණකින් මෙරට අධ්‍යාපනය බමුණන්ගේ කාර්යයක් වී යැයි කිව නො හැකි ය. දඹදිව භාරතයක් වී බමුණන් එහි ආධිපත්‍යය ලබාගත් බව පැහැදිලි නමුත් මෙරට වෛදිකකරණයකට ලක්වූ බවට සාධක නැත. මෙරට කිසි දිනෙක භාරතයක් නො වී ය. මෙරට වැසි විවිධ ගෝත්‍ර පැරණි අනාර්ය සංස්කෘතියෙහි  ජීවත් වූ බවට සාක්ෂි ඇත. එහෙත් අප අවධාරණය කරන කරුණ නම් අනාර්ය යනු ද්‍රවිඩ නොවන බව ය. අනාර්ය යන්නෙන් අප අදහස් කරන්නේ ආර්ය ද ද්‍රවිඩ ද නොවූ සංස්කෘතියකි.

මෙරට පැරණි ඉතිහාසය ගවේෂණය කරන්නකුට අප විසින් ඉහත සහ වෙනත් තැන්වල සඳහන් කෙරී ඇති කරුණු මත පදනම් වී නවතම අර්ථකථනයක් කළහැකි යැයි සිතමි. ඉතා කෙටියෙන් කිවහොත් ඒ පදනම මෙසේ ය. අවුරුදු විසිපන්දාහකට වඩා ඈතට යන සංස්කෘතියක්  පිළිබඳ සාධක මෙරට වෙයි. එකල වාසය කළෝ අනාර්ය ගෝත්‍රිකයෝ වූහ. යක්ෂ, නාග, දේව ආදී ගෝත්‍ර මෙන් ම ව්‍යාධ ගෝත්‍රය ද එදා විය. ව්‍යාධ ගෝත්‍රිකයෝ යනු අන් කිසිවකු නොව වැද්දෝ ය. කිතුවසින් සියවස් නවයජට පමණ පෙර දඹදිවින් වෛදිකයන් නොව වැඩිම වුවහොත් අර්ධ වෛදිකයෝ මෙරටට පැමිණියහ.

ඔවුන් එසේ පැමිණියේ වෙළඳාමට විය හැකි ය. දිව්‍යාවදානයෙහි හා ඇතැම් ජාතක කතාවල වෙළෙන්දන් ගැන ඇති පුවත්වලින් මෙරටට දඹදිවින් පැමිණි වෙළෙන්දන් ගැන කියැවෙයි. එහෙත් ඒ අතර දඹදිව සිදුවෙමින් පැවති වෛදිකකරණයට එරෙහිව නැතහොත් එයට මුහුණ දීමට නොහැකිව මෙරට පැමිණි අය ද සිටින්නට ඇත. භද්දකච්චනා කුමරිය එවැන්නකු විය යුතු ය. ඇය පැමිණ ඇත්තේ පරිබ්‍රාජිකාවක ලෙස වෙස්වළාගෙන ය. එයින් කියැවෙන එක් කරුණක් නම් ශාක්‍යයන්ට ඒ කාලය වන විටත් දඹදිව වාසයට සුදුසු පතිරූප දේශයක් නො වීම ය. අනෙක් අතට ශ්‍රමණ සම්ප්‍රදායට මෙරට හිරිහැරයක් නොවූ බව ය.

දඹදිව භාරතය බවට පත්වීමට සියවස් කිහිපයක් ගතවී ඇති බව පැහැදිලි ය. එහෙත් ඒ කාලය තුළ මෙරට වෛදික සංස්කෘතියට ගොදුරු නො වී ය. මෙරටට දඹදිවින් පැමිණියෝ එක්කෝ වෙළෙන්දෝ වූහ. නැතහොත් වෛදිකයන්ගෙන් නිදහස සොයා පැමිණියෝ වූහ. වැඩිම වුවහොත් අර්ධ වෛදිකයන් වූ මොවුහු බෞද්ධ හා ජෛන වූවෝ යැයි සිතිය හැකි ය. මේ අර්ධ වෛදිකයන් සියවස් ගණනක ඇවෑමෙන් මෙරට වාසය කළ ගෝත්‍ර බොහෝමයක් සමග එකතු වී පණ්ඩුකාභය රජ දවස සිංහල ජාතිය ගොඩනගා ඇති බව පැහැදිලි ය. සිංහල ජාතිය ගොඩනැඟීමේ දී යක්ෂ ගෝත්‍රයෙහි ඇතැමුන් එයට පූර්ණ සහයෝගය දී නොමැති බවත් ව්‍යාධ ගෝත්‍රය සම්පූර්ණයෙන් ම ඉන් බාහිර ව සිට ඇති බවත් පැහැදිලි ය.

දේව ගෝත්‍රිකයන් හා නාග ගෝත්‍රිකයන් මිහිඳු හිමියන් වැඩම කිරීමට පෙර ද බෞද්ධයන් වී යැයි ජනප්‍රවාද අනුව සිතාගත හැකි ය. බුදුන් වහන්සේ තෙවරක් ලංකාවට වැඩම කළ බවට ඇති කතාව දේව හා නාග ගෝත්‍රිකයන් එසේ මිහිඳු හිමියන් වැඩම කිරීමට පෙර ද බෞද්ධ වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට දී ඇති පිළිතුරක් ද වෙයි. මෙරට දේව වංශයට අයත් සියල්ලන් අදත් බෞද්ධයන් යැයි කියනු ලැබෙයි. සිංහල ජාතිය යනු එලෙස ගත්කල දඹදිවින් මෙරටට පැමිණි ජාතියක් නො වේ. පසු කලෙක ද භාරතයෙන් (දඹදිව භාරතය වීමෙන් පසුව) පැමිණි අය ඒ ඒ අවධියෙහි සිංහල ජාතියට අවශෝෂණය වූහ. එහෙත් සිංහල ජාතිය  යනු මෙරට වැසි අනාර්ය ගෝත්‍රිකයන් මුල්කරගෙන මෙරට ම බිහි වූ ජාතියකි. තමන් ආර්යයන් ලෙස සිතීම හේතුවෙන් සිංහලයන්ට තම අයිතීන් නැතිවීමට ඉඩ ඇත.

© Prof. Nalin De Silva

අද සිංහලයන් භාරතයෙන් පැමිණි ජාතියක් යැයි කීමට දැඩි උත්සාහයක් ගනු ලැබෙයි. එයට දීපවංසය හා මහාවංසය ද එක් අතෙකින් වගකිව යුතු ය. ඒ විජය පිළිබඳ කතා පුවතට වැදගත් තැනක් දීම හේතුවෙනි. දීපවංසය ලියු කාලයෙහි රාජ්‍ය බලය ලබාගත් කණ්ඩායමක් විසින් මේ පුවතට ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබී යැයි සිතිය හැකි ය. ඒ කණ්ඩායමට යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පිරිසකගෙන් තර්ජනයක් එල්ල වන්නට ඇතැයි ද සිතිය හැකි ය. එහෙත් ඒ පිළිබඳ තවත් කරුණු හැදෑරිය යුතු ය. ඒ කෙසේ වෙතත් සිංහල ජාතිය හා සිංහල සංස්කෘතිය මෙරට බිහිවූවා මිස භාරතයෙන් පැමිණියා නො වෙයි. ඒ අර්ථයෙන් ගත්කල සිංහලයෝ ද මෙරට ආදිවාසීහු වෙති.

දීපවංසය පස්වැනි සියවසට පෙර ලියැවිණි යැයි කියැවෙයි. එහෙත් ඒ කෙතරම් කාලයකට පෙර ද යන්න නිශ්චිතව කිව නො හැකි ය. හතරවැනි සියවස අවසන හා පස්වැනි සියවස මෙරට ඉතිහාසය එක් නිශ්චිත මගකට දැමූ කාල පරිච්ඡේදය යැයි කිව හැකි ය. සුභ හා වසභ රජවරුන්ගෙන් ඇරඹි ප්‍රථම ලම්බකර්ණ වංශය පරදවා මෞර්ය වාංශිකය යැයි කියන ධාතුසේන රජු රජවූයේ මෙකල ය. දීපවංසය ලම්බකර්ණයන්ට රාජ්‍යයට ඇති අයිතිය ප්‍රතික්ෂේප කිරීම සඳහා ලියැවිණි නම් මහාවංසය ඊනියා මෞර්ය වංශයකට රජකම හිමිකිරීමට හා ධාතුසේන කුමරුට රජකමට ඇති අයිතිය තහවුරු කිරීමටත් ඒ රජුට ගැමුණු කුමරු ආදර්ශයට ගැනීම සඳහාත් ලියන ලද්දක් යැයි සිතිය හැකි ය. ඒ පොත්වලින් හතරවැනි හා පස්වැනි සියවස්වල මෙරට පැවති තත්වය ද පිළිබිඹු වෙයි.

සත් ද්‍රවිඩ රජවරු පරාජය කිරීමට සිදුවූයේ ධාතුසේන කුමරුට ය. එළාර රජුට හා ගැමුණු කුමරුට දෙන ලද අර්ථකථන මගින් සත් ද්‍රවිඩ රජවරුන් පරාජය කිරීමට ධාතුසේන කුමරු පුහුණු කෙරිණි. බුද්ධඝොෂ හිමියන් හා එයට පෙර බුද්ධදත්ත හිමියන් ථෙරවාද පොත පත සිංහලෙන් පාලියට පරිවර්තනය කර අටුවා පාලියෙන් ලිවීම ඇරඹුයේ ද මෙකල ය. ථෙරවාද බුදු දහම රැකීම පිළිබඳ සංකල්පය සිංහලයන්ට ඇතිවූයේ (ඇති කරනු ලැබුයේ) මෙකල ය. ථෙරවාද බුදු දහම රැකීම පිළිබඳ සංකල්පය සමග අශෝක රජුගේ මෞර්ය වංශය හා තුන්වැනි සංගායනාව සමග සම්බන්ධකම්වලට නව අර්ථකථන මෙකල බලාපොරොත්තුවිය හැකි ය. ඒ අර්ථකථන භික්ෂූන් වහන්සේගේ මිස බමුණන්ගේ නොවූ බව අවධාරණය කළ යුතු ය.

අද වැද්දන් පමණක් මෙරට ආදිවාසීන් ලෙස හඳුනාගැනීමේ උත්සාහයක් පවතියි. විජය කුවේණි කතාවෙන් පැහැදිලි වන්නේ වැද්දන් සිංහල ජාතියෙන් පිටමංකිරීමත් අනෙක් පැත්තෙන් වැද්දන් සිංහල ජාතියට එක්වීමට අකමැතිවීමත් ය. එසේ වූ පමණින් වැද්දන් පමණක් ආදිවාසීන් වීමට හැකිකමක් නැත. ව්‍යාධ ගෝත්‍රිකයන් සමග මෙරට වාසය කළ අනෙක් ගෝත්‍ර (යක්ෂ ගෝත්‍රයට අයත් පිරිසක් හැර) සියල්ල සිංහල වත ඇත්නම් හා ඒ ගෝත්‍ර ද ආදි වාසීන් නම් සිංහලයන් ආදි වාසීන් නොවන්නේ කිනම් පදනමකින් ද?

වැද්දන් පමණක් ආදිවාසීන් කෙරෙන්නේ බටහිර සංකල්පයකට අනුව ය. බ්‍රිතානීන් අද ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය යනුවෙන් හැඳින්වෙන රටවලට යෑමට පෙර ඒ රටවල සිටි ගෝත්‍රිකයෝ හා ඔවුන්ගෙන් පැවත එන කිහිප දෙනා ආදි වාසීන් ලෙස හඳුන්වනු ලැබෙති. බ්‍රිතානියෝ ඒ රටවලට ඔවුන්ගේ ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතිය ගෙනගියහ. ඔවුහු ඒ රටවල සිටි ජනයා මුළුමනින් ම මෙන් සමූලඝාතනය කර තමන්ගේ සංස්කෘතිය ව්‍යාප්ත කළහ. අද ඒ රටවල ඇති සංස්කෘතිය ඒ ඒ රටවල නිපන් සංස්කෘතියක් නො වේ. ඒ සංස්කෘතිය මුළුමනින් ම ආනයනය කරනු ලැබුවකි. බ්‍රිතානියෝ දකුණු අප්‍රිකාවෙහි ද ඒ කිරීමට උත්සාහ කළහ. එහෙත් ඔවුන්ට ඒ රටවල ජනයාගෙන් යම් ප්‍රමාණයක් ඝාතනය කිරීමට නො හැකි විය. බ්‍රිතානීහු හා අනෙක් යුරෝපීයයෝ තමන් ගිය අනෙක් රටවල ජනයා විශාල ප්‍රමාණයක් ඝාතනයකිරීමට නොහැකි වුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රචලිත කළහ.

කෙසේ හෝ ආදිවාසීන් යනු බටහිර යටත්විජිතවාදීන් තම සංස්කෘතිය රැගෙන යුරෝපීය නොවන රටවලට ගොස් ඒ රටවල අති විශාල ජන සමූහයක් ඝාතනය කර තමන්ගේ සංස්කෘතිය තම වර්ගයා මගින් ඒ ඒ රටෙහි ස්ථාපිත කරගත් අවස්ථාවල ඒ ඒ රටෙහි ඉතිරි වූ මුල් ගෝත්‍රිකයන් කිහිප දෙනා හඳුන්වාදීමට යොදාගන්නා සංකල්පයකි. සිංහලයෝ මෙරටට දඹදිවින් සංස්කෘතියක් රැගෙන නො ආහ. සිංහල ජාතිය ද සිංහල සංස්කෘතිය ද බිහිවූයේ මේ රටෙහි ම ය. සිංහලයෝ නමින් පිරිසක් පැමිණ මෙරට සිටි ගෝත්‍රිකයන් සමූලඝාතනය කිරීමට පියවර නොගත්හ. සිංහලයන් බිහි වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම මෙරට සිටි ගෝත්‍රවලින් ය. එසේ නම් වැද්දන් පමණක් ආදි වාසීන්

© Prof. Nalin De Silva

වන්නේ කෙසේ ද? වැද්දන් පමණක් ආදි වාසීන් යන බොරුව ගොතන්නෝ බටහිරයෝ ය. ඒ සිංහලයන්ට මෙරට හිමි තැන නැතිකිරීමට ය. දෙමළ ජනයා මෙරටට පිට රටින් පැමිණි බව පැහැදිලි ය. දෙමළ ජනයා කෙසේවත් ආදිවාසීහු නො වෙති. බටහිරයන් අද තැත්කරන්නේ මෙරටට අනන්‍ය වූ සංස්කෘතියක් නිර්මාණය කළ සිංහලයන් ද ආදි වාසීන් ලෙස නො සැලකීමට ය. වැද්දන්ට පමණක් ආදි වාසීන් යැයි කීම බොරුවක් හා රැවටීමක් වෙයි.

අප සාකච්ඡා කරමින් සිටියේ බමුණන්ට මෙරට අධ්‍යාපනය භාර නො වීම ය. පණ්ඩුල බමුණා පණ්ඩුකාභය කුමරුට ඉගැන්වුව ද බමුණන්ට රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් එතරම් වගකීමක් නො පැවරිණි. එයට හේතුව වෛදිකයන්ට කිසි දිනෙක මෙරට බලය හිමි නො වීම ය. මෙරටට දඹදිවින් පැමිණියෝ අවෛදිකයෝ වූහ. මිහිඳු හිමියන් වැඩම කිරීමට පෙර මෙරට අධ්‍යාපනය බමුණන්ගේ ආධිපත්‍යය යටතේ තිබිණි යැයි කීමට වඩා විවිධ ගුරුකුල ආශ්‍රිතව තිබිණි යැයි  කීම නිවැරදි යැයි සිතමි.

ඒ කෙසේ වෙතත් මිහිඳු හිමියන් වැඩම කර නොබෝ කලකින් ම භික්ෂූන් වහන්සේ මෙරට අධ්‍යාපනය තමන් අතට ගත්තේ යැයි සිතිය හැකි ය. පස්වැනි සියවස වන විට ථෙරවාදී භික්ෂූන් වහන්සේ සමස්ත අධ්‍යාපනය ම තමන්වහන්සේ අතට ගෙන සිටියහ. ඒ වන විට උන්වහන්සේ මෙරට සමාජයේ විඳ්‍යතුන් වූහ. උන්වහන්සේගේ අදහස්වලට මහජනයා ඉතා බැති සිතින් සවන් දුන්හ. එබැවින් උන්වහන්සේට සැබවින්ම මහජනයාට යමක් කීමේ දී විශේෂ බලපෑමක් කළ හැකි විය. මහජනයා ගිහි ජීවිතයේ සීමා තුළ උන්වහන්සේ අනුගමනය කළහ. උන්වහන්සේ සියළු ප්‍රශ්න මැද වුවත් මහජනයාට විඳ්‍යතුන් වහන්සේ වූහ. එහෙත් අද තත්වය එසේ නො වේ. අද භික්ෂූන් වහන්සේට අධ්‍යාපනයෙහි වැදගත් තැනක් හිමි නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva